ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය 1979 වසරේ සිට ක්‍රීඩා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාඨමාලා පවත්වනු ලබන ප්‍රමුඛ ආයතනය වේ.

# ක්‍රීඩා අධ්‍යාපන පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම - 2021

## ශාරීරික යෝග්‍යතා උපදේශක පාඨමාලාව - (NVQ - 04)

වර්තමානයේ ශ්‍රී ලාංකික ජනතාව අතර උද්ගත වී ඇති බෝනොවන රෝග පාලනය කිරීම පිණිස ව්‍යායාම කිරීම සඳහා නිවැරදි උපදෙස් ලබාදිය හැකි විද්‍යාත්මක දැනුම හා ප්‍රායෝගික කුසලතා සහිත ශාරීරික යෝග්‍යතා උපදේශකයින් පුහුණු කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වේ.

**මෙම පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් 04 මට්ටමට (NVQ - 04) අනුකූලව පවත්වනු ලබන අතර පාඨමාලාව හැදෑරීම තුලින් ව්‍යායාම මධ්‍යස්ථානයක ශාරීරික යෝග්‍යතා උපදේශකවරයකු ලෙස සිය වෘත්තීය කටයුතු ආරම්භ කිරීමට හැකිවේ .**

**පාඨමාලා කාලය :** මාස 12 සෙනසුරාදා හෝ ඉරිදා දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා ගාස්තු :** රු. 20,000 .00

**පාඨමාලා මාධ්‍ය :** සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :** අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත්වීම සහ ක්‍රීඩා පසුබිමක් තිබීම.

වැඩිදුර තොරතුරු : **පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 234**

## පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව

ශ්‍රී ලංකාවේ පුහුණුකරුවන්ගේ ක්‍රීඩා දැනුම සහ කුසලතා සංවර්ධනය කිරීම සඳහා මෙම පාඨමාලාව පවත්වනු ලබන අතර මෙම වසරේදී **අත්පන්දු, පාපැදි ක්‍රීඩාව, සවාට් කික් බොක්සිං (Savate kick Boxing) පාපන්දු, දැල්පන්දු, වොලිබෝල් සහ හොකී** යන ක්‍රීඩා සඳහා වන පාඨමාලාවන්ට අයදුම්පත් කැඳවනු ලැබේ.

**මෙම පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කරන පුහුණුකරුවන් ශ්‍රී ලංකාවේ අදාල ක්‍රීඩාවේ පුහුණුකිරීම් සඳහා සුදුසුකමලත් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස සළකනු ලබන අතර එම පුහුණුකරුවන් මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර "පුහුණුකරු ලියාපදිංචි සහතිකය" නිකුත් කිරීමටද කටයුතු කෙරේ.**

**පාඨමාලා කාලය :** මාස 03 (සෙනසුරාදා හෝ ඉරිදා දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා ගාස්තු :** රු. 5,000 .00

**පාඨමාලා මාධ්‍ය :** සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. පුහුණු කරනු ලබන ක්‍රීඩාවට අදාලව අදියර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.
2. පුහුණුකරුවෙක් ලෙස වසර 05ක පළපුරුද්ද.
3. ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ අත්කරගත් ක්‍රීඩකයින් පුහුණුකර තිබීම.

වැඩිදුර තොරතුරු : **පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 241**

## ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I

වෘත්තියමය ක්‍රීඩා පුහුණුකරුවකු ලෙස සාර්ථකත්වය වෙත ළඟාවීමට අපේක්ෂා කරන පුහුණුකරුවන්ට (ආයතනගත හා ස්වේච්ඡා පුහුණුකරුවන්) ක්‍රීඩාවට අදාල නූතන තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වෙන අතර **බේස්බෝල්, කබඩි සහ මල්ලවපොර** යන ක්‍රීඩාවන්ට අදාල පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවේ.

**පාඨමාලා කාලය :** සති 06 (පැය 60කි. - සතියට දින 02 හෝ 03 බැගින් පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය :** සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු :** රු. 7,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. විවෘත මට්ටමේ නම්, දිස්ත්‍රික් ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම්, ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වීම හෝ එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකර තිබීම,

   හෝ
2. පාසල් මට්ටමේ නම්, කලාප ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම් ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වීම හෝ එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකර තිබීම,

   හෝ
3. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන විසින් පිරිනමන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

## ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I I

ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා නිවැරදි නූතන තාක්ෂණික දැනුම වැඩිදුරටත් ලබාදීමේ ඉදිරි පියවරක් ලෙස **ජූඩෝ, බැඩ්මින්ටන් සහ වොලිබෝල්** යන ක්‍රීඩාවන්ට අදාලව පාඨමාලා පැවැත්වීමට නියමිතය.

**පාඨමාලා කාලය :** සති 12 (පැය 120 - සතියට දින 02 හෝ 03 බැගින් පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

**පාඨමාලා මාධ්‍ය :** සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා ගාස්තු :** රු. 10,000.00

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I (ජූඩෝ, බැඩ්මින්ටන් සහ වොලිබෝල්) සමත්ව තිබීම,

   හෝ
2. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන විසින් පිරිනමන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

   සහ
3. ජාතික/පළාත්/දිස්ත්‍රික්ක මට්ටමේ ජයග්‍රහණ අත් කරගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකර තිබීම.

වැඩිදුර තොරතුරු : **පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 236**

**වැදගත් :** මෙම පාඨමාලාවන් සඳහා බඳවා ගැනීමේදී ඉල්ලුම් කර ඇති සුදුසුකම් වලට අමතරව ඉදිරිපත් කරනු ලබන ඉහල දක්ෂතා සහ ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සඳහා ප්‍රමුඛතාවක් හිමිවේ.

### අයදුම්පත් එවියයුතු ආකාරය

සියළුම පාඨමාලා සඳහා අයදුම්පත් www.niss.gov.lk වෙබ් අඩවියෙන් හෝ සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.4.00 දක්වා ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය වෙත පැමිණ ලබාගත හැක. **සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021 අප්‍රේල් මස 28 දිනට හෝ ඊට පෙර, අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, 100/7, නිදහස් මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

**සැ.යු : අයදුම්පත බහාඑවන කවරයේ වම්පස ඉහල කෙළවරේ අයදුම්කරන පාඨමාලාව/ ක්‍රීඩාව සඳහන් කළ යුතුය.**